රත්න ශ්‍රී විජේසිංහ

විමලරත්න කුමාරගම

නැවත කියැවීම

විමලරත්න කුමාරගම (1919 - 1962) සිය හතළිස් හතර හැවිරිදි ජීවිතයෙන් වසර විසි හතරක්ම කවිය සමඟ අවියෝජදීයව බැඳෙමින් දිවි ගෙවුවෙකි. 1935 වසරේදී සිය සොහොයුරියගේ වියෝව නිසා හටගත් සංවේදනා 'සංවේග වේදනා' නමින් කවි පොතකට ගොනු කරමින් තම මුල්ම කවි ලිවීම ඇරඹූ හෙතෙම, හතළිස් හතර වන විය සපුරන්ට දින දාහ අටක් තිබියදී, 1962 දෙසැම්බර් 30 දා මහනුවර රෝහලේදී සමුගෙන යන්නට දින කීපයකට පෙරද කවි ලියුවේය. දිනපොතේ ලියූ කවි අතර ඔහුගේ අවසන් කවිය හමුවන්නේ දෙසැම්බර් 17 දා ය.

ජීවත් ව සිටියදී ඔහුගේ කෘතීන් අතරින් පළවී ඇත්තේ, 'සංවේග වේදනා' සහ 'හපුමලී' යන කෘතීන් පමණි. 'විමලරත්න කුමාරගම', 'නොපළ කවි', සහ 'මහපාර' යන කෘතීන් ප්‍රකාශයට පත්වන්නේ ඔහුගේ අභාවයෙන් පසුවය. එහෙත් විවිධ ප්‍රවෘත්ති පත්‍රවලත්, දේදුන්න, මිවදය, සුවඳ වැනි මාසික කවි සඟරාවලත් ඔහුගේ කවි බෙහෙවින් පළ විය. එමෙන්ම, පෝවලී, කුමාර පෝ මාලා, නවීන පෝ රචනා, නූතන කාව්‍ය සංග්‍රහය ආදී කාව්‍ය සංග්‍රහවලට ඇතුළත්ව ඔහුගේ බොහෝ කවි, සා.පෙළ හා උසස් පෙළ පාඩ ග්‍රන්ථ ලෙස විචාරිනු දිඩු කලක් පරිහරණය කළහ. එහෙයින් හැත්තෑව දැකයෑමට පෙර පාසල් හැර ගිය, අද මැදිවියේ නැතහොත් ඒ ආසන්නයේ ඉන්නා සහෘදයින් බොහො දෙනෙක් කුමාරගම හඳුනති. කොළඹ යුගයේ ගැඹුර නැතහොත් කොළඹ යුගයේ දාර්ශනික කවියා ලෙස ඔවුන්ගේ ලෝකයේ සුවිශේෂී තැනක් අදත් කුමාරගමට හිමිවී තිබේ.

කුමාරගම කවියාගේ සියලු ම රචනා එක්තැන් වී ප්‍රකාශයට පත්වන්නේ 1987 වසරේදීය. සුසිල් සිරිවර්ධන සහ එස්. විජේසූරිය එක්ව සංස්කරණය කළ 'විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි' නමින් වූ එම කෘතියට ඔහු ලියූ බොහෝ කවි ඇතුළත් වී ඇතද ඇතැම් රචනා එයට ද ඇතුළත් වී නැති බව පෙනේ. නිදසුන් දෙස, 1948 මාර්තු 'දේදුන්න' පල වන කාණ්ඩයේ හත් වන කලාපයේ, හයවන පිටුවේ පළවී ඇති 'වත්නියේ සෝරත' නම් රචනය දක්විය හැකිය. කවියාගේ අපූරු ප්‍රතිභාව පළකෙරෙන තවත් එබඳු අපූකට රචනා තිබිය හැකිය. යට කී කවි එකතුවට දීර්ඝ පෙරවදනක් සපයන සංස්කාරකයෝ, එකෙක් විචාරකයින් විසින් අතපසු කළ කුමාරගමගේ කවි ගැඹුරින් විමරනය කිරීමේ උත්සාහයටද උරදෙති. සමාජ, ආර්ථික හා දේශපාලනික පසුබිමක කුමාරගමගේ කවියට හිමිවූ භූමිකාව විමර්ශනයට තැත් කරන ඔවුන් වෙතින් ඔහුගේ කවියේ කලාත්මක නැඹුරුව හා දාර්ශනික නැඹුරු ප්‍රමාණවත් තරමින් සාකච්ඡා නොවීම අඩුවකි. එමෙන්ම ඔහුගේ ජීවිතය පිළිබඳ සපයා ඇති කෙටි සටහන ද නිවැරදි නොවේ. එහෙයින් ඔහුගේ කාව්‍ය ජීවිතයේ අවධි - කඩඉම් පිළිබඳව කෙරෙන සලකුණු ද සංශෝධනය විය යුතුව තිබේ.

කවියෙන් අධිරාජ්‍ය විරෝධී අරගලය නියෝජනය කළ ඇස්. මහින්ද හිමියන් හෝ වාමවාදී දේශපාලන නැඹුරුවකින් යුතුව, සෘජුව ම ධනේශ්වර ක්‍රමය පිළිබඳ තියුණු විවේචන එල්ල කළ පී. බී. අල්විස් පෙරේරා හෝ මෙන් විමලරත්න කුමාරගම කවිය හා කාලීන දේශපාලන ප්‍රවණතා සෘජුව සම්මුඛ කළේ නැත. පසෙක දේශපාලනයට පිවිසෙමින් පසුව පාර්ලිමේන්තුව පවා නියෝජන කළ කේස්ස් වැනි කවියකුගේ වුවද දේශපාලන දෘෂ්ටිය කවියේ සරල යථාර්ථ නිරූපණය සමඟ ප්‍රතිබද්ධව පැවතිණ. කුමාරගම කවියාගේ දේශපාලන භාවිතය පැවතියේ කේස්ස් ගේ එකී සරළත්වය ඉක්මවන, අතිශය සංකීර්ණ තලයකය. ඔහුට මුණ ගැසෙන සියලු සත්‍ය සතුන් ද ගහවැල්ද පරිසරයද ඔහු දුටුවේ පංචි සමාජයේ පරත්වා රෝපණයෙන් පීඩිත වස්තූන් ලෙසය. කුමාරගමට හමු වූ බොහෝ මිනිසුන් හා ගැහැණුන් ගේ ගති සොබා හුදු - වියුක්ත ප්‍රපංච නොව, සමාජ අර්ථ ක්‍රමයේම නිෂ්පාදනයන්ය. ඒ බැව් සඟවන්නට ඔහු කවියේ සෞන්දර්යය හා රොමැන්ටික් අලංකරණ ඉස්මතු කළේ නැත. නැතහොත් ඔහුගේ අත්දැකීම්වල යථාර්ථවත් ගුණය, එකී අලංකරණ ඉක්මවා පැවැත්තේය.

එකතු කළ කවි කෘතියේ සංස්කාරකවරුන් කියා සිටින පරිදි, කුමාරගමගේ ගතානුගතික හා හුදු සම්ප්‍රදාය වාදී අවධිය වසර එකොළහක් නොව සයකි. ඔහු 1941 වසරේදී පුත්තලමේ සේවයට ගොස් ඇති බැවිනි. (පරිශිෂ්ටය - කවියා සුගුණපාල සමරසේකර කවියට ලියූ පොද්ගලික ලිපි - 1941.-4.20 - පුත්තලමේදී) එම වන්නියේ පරිසරය කවියා ගතානුගතිකත්වයෙන් මුදවා ගෙන ලෝකයට ගෙනෙන්නට එතරම් කල් ගත්තේ නැත. ආරම්භයේදී පුන පුනා කියමින් සම්ප්‍රදායික වැනුම් මගෙක පමා වූ කුමාරගම, අනවශ්‍ය දිඩු කිරීම්වලින් තොරව, ඔහුගේ දාර්ශනික ආස්ථානයට එන්නේ කෙටි රචනා වලදීය. රාජ්‍ය සේවයේ සීමාවන් ගේ වෙනත් හේතූන් ... නිසා සිය හැදෑරීම්වලට මාක්ස්-භාවයෙන් උදව් නොලබන ඔහු, බුදු දහමේ දාර්ශනික හරයන්, ඉන් නිර්දේශිත දිවි පැවැත්මත් සිය දක්මට ගුරු කොට ගනී. එමෙන්ම පෙර - පර දෙදිග කවීන්ගේ චින්තන පද ඔහුගේ කවි සිතට මඟ පෙන්වයි.

නිසලස සාන්තය ගස්වැල් වැව	අවට
මා විසි කළේ පොඩි ගල් කැඩයක්	වැවට
රස රළ වළඳ දී දිය රග ගනි	රුවට
එක කවියකින් නොකළැකි මොනවද	ලොවට

'ගල් කැටය' නම් මේ කව, කවියෙහි මහිමය උත්කෘෂ්ටයට නඟන්නක් බව පෙනෙතත් එය එසේ ම නොවේ. කුඩා ගල් කැටයක ශක්තිය ලෝකය වෙනස් කරන, තාත්වික ව්‍යසනයෙන් සිදුවන දාම ප්‍රතික්‍රියාක් සේ පැතිර යයි. අල්පෝක්තියම මහෝක්තියත් බවට පත්වේ.

'තෙරුවන' ද, යථාර්ථය ප්‍රශ්න කෙරෙන එබඳු ම කුඩා කවකි. ආපෙ දහම, සදාචාරය පවතින්නේ හුදු දාර්ශනික පදනම් මත නොව සැමදා ලෝකයේ සමාජ අර්ථ ක්‍රම පද්ධතිය මතය. නො එසේව ගිය කල සියලු දාර්ශනික, සදාචාර දැනුම් ව්‍යාජයන් විහිළුවක් වේ.

වැරහැලි දුරු දරුවකු මගදී	හමුවුනී
තෙරුවන දනින්දයි ඇසුව්වදී	වැනි වැනී
දුන් පිළිතුරෙන් මා මහපාරෙ	හඳිමනී
තාත්තාගේ පය - මහපාර -	බඩගිනී

දරුවා දන්නා තෙරුවන නම් ඒය. තාත්තාගේ පය පළමුවැන්නයි. එය කැඩී බිඳී ගියේ වන. එහෙයිනි, ඔහුට මහපාර හිමිවූයේ. ඒ නිසා ඔහු හඳුනන අවසන් රූවන බඩගින්නයි.

'රිදුම' නම් කවිපෙළට ඇතුළත් විවිධ දාර්ශනික අර්ථ, වියුක්ත සත්‍යයන් සේ පෙනෙතත්, ඒවා එකිනෙක අතරද අනෙන්‍යතාවක් වේ.

සුළු වූ නමුත් එළියක් නම්	සැනසිලිය
ඇස් නැතියවුන් හට එය සඳහට	නිලිය
මුළු ලොව අඳුර දිව ආවත්	එකවලිය
නිවනට නොහැක පොඩි මැටි පාදක	එළිය

ඉහත කව, රවීන්ද්‍රනාත් තාගෝර් කවියාගේ ප්‍රකට රචනාවක් වන, .ඬැළ පැ එසධයළ පහ ක්පළ්ගී්ළ්ර්. ආදී කවියේ අරුතින් එළියක් ලබා තිබේ.

'රිදුම' කවි පෙළ කුමාරගම නිමන්නේ පහත ප්‍රශ්නාවලිය නඟමිනි.

ඇණ බැන ගැනීමෙන් බත් පත	පිරුණාද
අඹු දරුවන්ගෙ සෝ දුක් මඟ	හැරුණාද
පිය තෙපළකින් බැරි වැඩ පල	කෙරුණාද
ජීවත් වෙන්ට කොපමණ අය	මැරුණාද

සරළ සේ පෙනෙතත්, සියලු දෙනා මියයන්නේ ජීවත්වන්නට තැත් කරමින්, ජීවිතය හා පොරබැඳීමේදී නොවේදැයි කවියා හඳන පැනය එතරම් සරළ නැත. පීඩිත සුන්දරත්වය වෙනුවෙන් මැදිහත් වී තම යක්ති ප්‍රමාණයෙන් ක්‍රියාකාරී වීමටද කවියා විටෙක උත්සාහ දරයි.

මෙතුවක් දුලි කා මාවත පාප	කළ
මම මේ හැඟීන් ඔසවා ගමි	රෝස මල
වටිනාකමක් නොදැනෙන අත	විසි කළ
නොගැටිය යුතුය ඔබ වරදින	පාදවල
(රෝසමල)	

කළවානේදී නම් රචනයට වස්තු විෂය වී ඇත්තේ යස ඉසුරු අසීයසට දැක් විදින ඒවා අහිමි මිනිසුන්ගේ පවතයි. එහිදී ද කවියා ඔවුන් වෙනුවෙන් ස්වයං කථනයක යෙදෙයි.

මට අතවැසි අයට මම අතවැසි ද	වෙමි
ඉන්වා ඔවුන්ගේ හැම සැලකුමට	හිමි
සෙවණක් නැතිව මුත් අව්වැසිවලට	කෙමි
මුළු ලෝකයම මගෙ සුරතින් සෙවණ	දෙමි

කවියාගේ පරාර්ථ සාධන චින්තනයට නැඹුරු දේශපාලන අරුත් පද නම් නොවුවද, මානව ගුණයම උත්කෘර්ෂයට තනන්නට ඔහු දරන මේ උත්සාහය නිර්දේශපාලනික වූවක්ද නොවේ.

ළබන කලාපයට

සන්නස ට එක් වෙන්න
සන්නස මාසිකය ඔබ ප්‍රාන්තයේ බෙදා හැරීමේ කටයුත්තට අප හා එක්වන්නට කැමති නම් කරුණාකර අදම අප අමතන්න.

Tel : 0422 671 826
Sannasa
PO Box 172 Reservoir
Vic 3073
email : info@sannasa.net